# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2305/50 - 2022 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2022.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස තුනක කාල සීමාවක් ප්‍රාදේශීය සභා රැස්වීම්වලට සහභාගි නොවීම හේතුකොට ගෙන කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66ආ (2) වන වගන්තිය යටතේ තනතුරු දැරූ සභාපති වන මානික්ක වඩුගේ වජිර දර්ශන ද සිල්වා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ප්‍රියන්ත උපුල් හේවගේ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කහවත්ත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සුරංග අඹගහතැන්නෙ වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය වූ 66ආ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ප්‍රියන්ත උපුල් හේවගේ, කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**සුරංග අඹගහතැන්නෙ,**
තේරීම්භාර නිලධාරී,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 11-0117



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය)**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස තුනක කාල සීමාවක් ප්‍රාදේශීය සභාවේ රැස්වීම්වලට සහභාගි නොවීම හේතුකොට ගෙන කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වන වගන්තිය යටතේ කහවත්ත ප්‍රාදේශීය සභාවේ අංක 3 වැල්ලදූර කොට්ඨාසයට තේරී පත්වූ මානික්ක වඩුගේ වජිර දර්ශන ද සිල්වා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම කහවත්ත ප්‍රාදේශීය සභාවේ අංක 3 වැල්ලදූර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඕපාත මුහන්දිරම්ලාගේ ප්‍රභාත් ජනක සිල්වා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද,

කහවත්ත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සුරංග අඹගහතැන්නෙ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ඕපාත මුහන්දිරම්ලාගේ ප්‍රභාත් ජනක සිල්වා, කහවත්ත ප්‍රාදේශීය සභාවේ අංක 3 වැල්ලදූර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**සුරංග අඹගහතැන්නෙ,**
තේරීම්භාර නිලධාරි,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 11-0118

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.